# මිනිසත් බව හඳුනාගත් මිනිසෙක්

සිංහල දෙමළ සමගිය පළුදුවෙමින් පැවති යුගයක ඔහු ද්‍රවිඩයකු වශයෙන් යාපනයේ උපත ලැබුවත් පටු ජාතිවාදී විෂ බීජයන් ඔහුගේ සිත් සතන් තුළ කලෙකත් පැලපදියම් නොවුණි. ඔහු බුද්ධිමතෙක් මෙන්ම ජාත්‍යන්තර වාදියෙක්ද විය. ජාත්‍යන්තර අත්දැකීම් රාශියකින් ලත් මුහුකුරාගිය ඥාණයක් ඔහුට තිබුණි.අපේ රට යටත් විජිතයක්ව පැවති සමයේ සිට සුදු අධිරාජ්‍යවාදීන්ගේ උපක්‍රමය වුයේ බෙදා වෙන්කර පාලනය කිරීමයි. ඔහුන්ගෙන් පසු පාලන බලය හිමිකරගත්, ඔහුන්ගේ නිල ලත් නියෝජිතයන්වුත්, ඔහුන්ගේ නෂ්ඨාවශේෂයන් ලෙස මෙරට පාලන බලය හිමිකරගත් සිංහළ මහ ධනපති පංතියද සුද්දාගේ එම පිළිවෙතම අනුගමනය කරන බව ද ඒ නිසාම දිනෙන් දින තම ජනතාවගේ ප්‍රශ්ණ උග්‍රවන බවද මේ තරුණ නායකයා මනාව තේරුම් ගෙන තිබුණි.එපමණක්ද නොව අධිරාජ්‍යවාදීන්ගෙන් ලැබු ඊනියා නිදහසින් පසු සිංහළ ධනපති රොත්තත් දෙමළ ධනපති රොත්තත් එම ඊනියා නිදහසේ අග්‍රඵලය මේ දෙගොල්ලන්ම, සහයෝගිව භුක්ති විඳින බවත්, නිර්ධනයාට ලැබෙන්නේ ඔවුන් විසින් උරාබී ඉවත දමන ලද හපය බවත් ඔහු මනාව වටහාගෙන තිබුණි.

සැබවින්ම මෙය වෙනස් කළයුතු විය. එය වෙනස් කිරීමටනම් ඊනියා පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයෙන් බැහැර විය යුතුය. ඒ සඳහා එකම මාර්ගය සන්නද්ධ අරගලය මිස වෙනත් විකල්පයක් ධනපති පාලකයින් විසින් තමන් වෙත ඉතිරිකර නොමැති බවද ඔහු අවබෝධ කරගෙන සිටියේය.

මේ අවදිය වන විට ඊළාම් රාජ්‍යයේ එකම හිමිකරුවා වීම සඳහා පැසිස්ට්වාදී ප්‍රභාකරන් විසින් අනෙක් සියළුම පක්ෂ හා කණ්ඩායම් සහමුලින්ම විනාශකර දැමීම සඳහා කටයුතු කරමින් සිටි යුගයක් විය.සැබෑ ලෙසින්ම මානව හිතවාදියෙක් මෙන්ම යථාර්ථවාදියෙක් වු පත්මනාභා සහෝදරයා 1987 ජේ.ආර්.- රජීව් ගිවිසුම අනුව පළාත් සභා ක්‍රමයෙන් තම ජනතාවගේ ප්‍රාර්ථනාවන් ඉටුකර ගතහැකි බව දුටුවේය. මෙතෙක් කල් තම මාතෘ භූමිය තුළ ගලාගිය රුධිර ගංගා නවතාලිය හැකි එකම මග මෙම ගිවිසුම ක්‍රියාවට නැංවීම බව ඔහු තරයේ විස්වාස කළ හෙයින් තුවක්කුව අතහැර ප්‍රජාතන්ත්‍රවාදී මගට පිළිපන්නේය. ලේ පිපාසිත ප්‍රභාකරන් හැරෙන්නට අනෙකුත් සියළුම කල්ලි කණ්ඩායම් සාමය අගය කරමින් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයට එක්වුණි.

සෑම ප්‍රශ්ණයක් පිළිබඳවම යථාර්වාදී දැක්මකින් බැලූ පත්මනාභ සහෝදරයා සිංහළ දෙමළ සමගිය ඉතා සිතින්ම ප්‍රාර්ථනා කළ අයෙක් විය.බහුතරයක් සිංහළයින් වෙසෙන මේ රටේ, සුළු ජාතීන්ගේ ස්වංයවර්ත්වය රැකගතහැක්කේත්, දිනාගතහැක්කේත් සිංහළ බහුතරයේ හදවත දිනාගැනීමෙන් පමනක් බව ඔහු අවබෝධකරගෙන සිටියේය.විශේෂයෙන්ම මේ සඳහා වාමාංශික අදහස් වලින් යුත් විවිධ කොටස් ඇතුළු දකුණේ ප්‍රගතිශීලීන්ගේ සහයෝගය අවශ්‍ය බව අවබෝධ කරගෙන සිටියේය.ඔහු එය අවබෝධ කරගත්තා පමණක් නොව එය සාක්ෂාත් කරගැනීම සඳහා ක්‍රියාමාර්ගයන්ද ගනුලැබීය.

දයාන් ජයතිලක (වත්මන් ස්විට්සර්ලන්තයේ තානාපති) අතුළු කණ්ඩායම (විකල්ප කණ්ඩායම) සමග පවත්වනු ලැබු සහ සම්බන්ධතාවය (1970 දශකයේදී)එහි එක් අවස්ථාවක් ලෙස දැක්විය හැකිය. මෙයින් ඉස්මතුවන තවත් කාරණා දෙකක් නම් දකුණේ සිංහළ ජනයාත් සමග මුසු වීමට උතුරේ මෙම තරුණ නායකයා තුළතිබු දැඩි අභිලාශයත් ඔහුගේ දූරදර්ශී භාවයත්ය. ඒ සමගම එම දිගු ගමනේ ඉතිහාසයත් මෙයින් මැනවින් පැහැදිලි වන්නේය. පත්මනාභ සහෝදරයා, ඔහුගේ සමකාලීනයකු වුත් ඔහු මෙන්ම මානව හිතවාදියකුවුත් විජය කුමාරණතුංගයන් සමග ද දේශපාලන හිතවත්කමක් පවත්වාගෙණ තිබුණි.මේ සියල්ල කිරීමට ඔහුට හැකියාව ලැබුණේ දකුණත් සමග සබඳකම් පැවැත්වීමට ඔහු තුළ වු පැවති දැඩි කැමැත්තත්, ඔහුගේ විචක්‍ෂන බුද්ධියත්ය.

තම අදහස් වලට, මතවාදයට එරෙහිවන ඕනෑම කෙනෙක් තම ජාතියේ වේවා, හෝ නොවේවා කිසිදු පැකිලීමකින් තොරව බිල්ලට ගැනීම ප්‍රභාකරන්ගේ සිරිතය. දෙමළ ජනතාවගේ පරම හතුරා ප්‍රභාකරන්යැයි කීවොත් එය නිවැරදිය.මේ මිලේච්චයා ඉතා තිරශ්චීන ලෙස එදා එනම් 1990 ජුනි 19 වෙනි දින මේ රටේ දුක්විඳින ජනතාවගේ විමුක්තිය වෙනුවෙන් ඉදිරියට ආ ඔහු ඇතුළු 13 දෙනකුගේ ජීවිත බිලිගත්තේය. මෙසේ නායකත්වය ඝාතනය කිරීමෙන් ප්‍රභාකරන් බලාපොරොත්තු වුයේ ඔවුන්ගේ එම ගමන නවත්වන්නට නම් එය මුළාවකි.

එදා ඔහුන්ගේ අතින් ගිලිහුන එම ධජය දැඩිව ග්‍රහණයට ගෙන අධිෂ්ඨාන පුර්වකව ඉදිරියට යන ඊළාම් ජනතා විප්ලවකාරී විමුක්ති පෙරමුණේ සහෝදරවරුන්ට දකුණේ ජනතාවගේ පුර්ණ ආශිර්වාදය හිමිවිය යුතුය.